ඉන්දියානු මහ **කොමසාරිස්** කාර්යාලය

**කොළඹ**

පුවත්පත් නි**වේදනය**

<u>මහ **කොමසාරිස්තුමා** ඉන්දියානු නිවාස ව්‍යාපෘතියේ තෙවන අදියරේ ප්‍රතිලාභීන් වෙත සූර්යබල ලන්තෑරුම් බෙදා දේ</u>

2024 අගෝස්තු 19 සිට 21 වන දින දක්වා ඉන්දියානු මහ කොමසාරිස් සන්තෝෂ් ජා මහතා විසින් සිදු කරන ලද මධ්‍යම පළාත් සංචාරය අතරතුර එතුමා අගෝස්තු 20 වන දින මාතලේ දිස්ත්‍රික්කයේ පිටකන්ද, රත්තොට වතු යායේ සංචාරයක නිරත විය.

2. පිටකන්ද, රත්තොට වතුයායේ ඉදිකර ඇති නිවාස ඉන්දියානු නිවාස ව්‍යාපෘතියේ තෙවන අදියර යටතේ ශ්‍රී ලංකාවේ ඉන්දිය සම්භවයක් ඇති දමිළ ප්‍රජාව නියෝජනය කරන වතු සේවකයන් වෙනුවෙන් ඉදිවන නිවාස 4000ට ඇතුළත් වේ.

3. අගෝස්තු 20 වන දින එතුමා සිදු කළ සංචාරය අතරතුර මහ කොමසාරිස්තුමා වතුයායේ ප්‍රතිලාභී නිවාස වෙත සූර්යබල ලන්තෑරුම් ද බෙදා දුන්නේය. ඉන්දියානු නිවාස ව්‍යාපෘතියේ තෙවන අදියර යටතේ ඉදිවන නිවාස 4,000 සඳහා ම සූර්යබල ලන්තෑරුම් ලබා දෙනු ඇත.

4. සූර්යබල ලන්තෑරුම් බෙදා දීම පසුගිය වසරේදී ශ්‍රී ලංකා ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා විසින් සිදු කරන ලද ඉන්දීය සංචාරය අතරතුර ඉන්දීය සම්භවයක් සහිත දමිළ ප්‍රජාව ශ්‍රී ලංකාවට පැමිණ වසර 200ක් සපිරීම නිමිත්තෙන් ඉන්දියාව විසින් නිවේදනය කරන ලද ඉන්දීය රුපියල් මිලියන 750ක බහු ආංශික ප්‍රදාන පැකේජයේ මුලපිරීමකි.

5. ඉන්දියානු නිවාස ව්‍යාපෘතියේ සිව්වන අදියර යටතේ ඉදිකිරීම් මේ වන විටත් ආරම්භ කර ඇති අතර මේ යටතේ වතුකර ප්‍රදේශවල නවත් වතු කම්කරු පවුල් 10,000ක් සඳහා නිවාස ඉදිකෙරෙනු ඇත.

***

**කොළඹ**

***2024 අගෝස්තු 22***